8465

OL/2023(2024)/63-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

ව්‍යවසායකත්ව අධ්‍යයනය	I, II	පැය තුනයි
முயற்சியாண்மைக் கற்கை	I, II	மூன்று மணித்தியாலம்
Entrepreneurship Studies	I, II	Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ව්‍යවසායකත්ව අධ්‍යයනය I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සුපුන් සිල්වා කොවිඩ් වසංගත සමයේ සනීපාරක්ෂක හා විෂබීජහරණ දියර අලෙවිකරන ව්‍යාපාරයක් ආරම්භ කර එය අතිසාර්ථකව පුළුල් කරන ලදී. මේ සඳහා සුවිශේෂී වූ ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ
(1) සුබවාදී වීම ය. (2) පරිසර සංවේදී බව ය.
(3) නොපසුබස්නා උත්සාහය ය. (4) ස්වාධීනත්වය ය.

2. ව්‍යවසායකත්වය යනු
(1) සහජයෙන්ම උරුම වන දෙයකි.
(2) අධ්‍යාපනය තුළින් ම පමණක් වර්ධනය කර ගන්නා දෙයකි.
(3) තාර්කික මිනිස් චින්තනය හා බැඳුනු දෙයකි.
(4) අත්දැකීම් තුළින් පමණක් ලබා ගන්නා දෙයකි.

3. සිනමාලෝලීන්හට අන්තර්ජාලය හරහා දායකත්ව මුදල් ගෙවා සිනමාපට නැරඹීම සඳහා අවස්ථාව සලසා දීම සැලකිය හැක්කේ
(1) නව සොයා ගැනීමක් ලෙස ය. (2) අනුකරණය කිරීමක් ලෙස ය.
(3) දිගුවක් ලෙස ය. (4) සංකලනයක් ලෙස ය.

4. නවෝත්පාදනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නවෝත්පාදනය අපේක්ෂිත සිදුවීමකි.
(2) නවෝත්පාදනයේ ආරම්භය නිර්මාණශීලී අදහසකි.
(3) නවෝත්පාදනය පුද්ගල ආකල්ප වෙනස්වීම මත පදනම් නොවූවකි.
(4) නවෝත්පාදනය පාරිභෝගික අවශ්‍යතා වෙනස්වීම මත පදනම් නොවූවකි.

5. සේවාවක ලක්ෂණයක් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) අවස්ථානුකූලව සේවාවක ක්‍රියාවලිය වෙනස් නොවේ.
(2) සැමවිටම සේවාවක සමජාතීය බව ආරක්ෂා කළ හැකි වේ.
(3) සේවාවක් සැපයුම්කරුවන්ගෙන් වෙන්කළ හැකි ක්‍රියාවලියකි.
(4) බොහෝවිට පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසකි.

6. මාගම්පුර කාන්තා සංවිධානය රටකජු වගාව හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ප්‍රචලිත කරමින්, කාන්තා රැකියා වියුක්තිය පිටුදැකීමට පිටුවහලක් ලබා දෙයි. මෙම මාගම්පුර කාන්තා සංවිධානය හැඳින්විය හැක්කේ
(1) අභ්‍යන්තරික ව්‍යවසායකයකු ලෙස ය. (2) ආයතනික ව්‍යවසායකයකු ලෙස ය.
(3) සමාජයීය ව්‍යවසායකයකු ලෙස ය. (4) ව්‍යාපාර ව්‍යවසායකයකු ලෙස ය.

7. ව්‍යවසායකයෙකු විසින් තම ආයතනයේ සේවකයින්ගේ සෘණාත්මක ආකල්ප වෙනස් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග අයත් වන්නේ
(1) අයිතිකරුගේ භූමිකාවට ය. (2) නායකයාගේ භූමිකාවට ය.
(3) කළමනාකරුගේ භූමිකාවට ය. (4) ආයෝජකයාගේ භූමිකාවට ය.

[දෙවැනි පිටුව බලන්න.

8. ව්‍යාපාර පරිසරය විස්තර කෙරෙන පිළිතුර තෝරන්න.
(1) ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ව්‍යාපාර අභ්‍යන්තරයෙන් ධනාත්මක බලපෑම් ඇති කරන සාධක හා බලවේග සියල්ලම ය.
(2) ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ව්‍යාපාර අභ්‍යන්තරයෙන් සෘණාත්මක බලපෑම් ඇති කරන සාධක හා බලවේග සියල්ලම ය.
(3) ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ව්‍යාපාර අභ්‍යන්තර මෙන්ම බාහිරව ධනාත්මකව බලපෑම් ඇති කරන සාධක හා බලවේග සියල්ලම ය.
(4) ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ව්‍යාපාර අභ්‍යන්තර මෙන්ම බාහිරව ධනාත්මක හා සෘණාත්මක බලපෑම් ඇති කරන සාධක හා බලවේග සියල්ලම ය.

9. උත්සව සමයේ දී බිත්තර ආනයනය සීමා කිරීම, දේශීය බිත්තර සැපයුම්කරුවන්ට බලපෑම් කරනු ලබන්නේ
(1) ශක්තියක් ලෙස ය. (2) අවස්ථාවක් ලෙස ය.
(3) තර්ජනයක් ලෙස ය. (4) දුර්වලතාවයක් ලෙස ය.

10. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නෛතික පරිසරය, කළමනාකරුවන්, සේවකයන්
(2) අයිතිකරුවන්, සංස්කෘතික පරිසරය, සේවකයන්
(3) කළමනාකරුවන්, පාරිභෝගිකයින්, අයිතිකරුවන්
(4) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්

11. ව්‍යාපාරයක බාහිර පරිසරය තුළ ඇති සැබෑ වෙනස්කම් අවබෝධ කර ගැනීම තුළින් ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ
(1) ව්‍යාපාරය සතු ශක්තීන් හඳුනා ගැනීම ය.
(2) ව්‍යාපාරය මුහුණ දෙන දුර්වලතා හඳුනා ගැනීම ය.
(3) ව්‍යාපාරයට පවතින විවිධ ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම ය.
(4) තමාගේ තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වීම ය.

12. වෙළෙඳපොළෙහි පවතින හිදැස හොඳින් අධ්‍යයනය කර ආරම්භ කරනු ලැබූ ව්‍යාපාරයක් වන්නේ
(1) දියවැඩියා රෝගීන් සඳහා විශේෂිත ආහාර වර්ගයක් නිපදවීම ය.
(2) කුඩා ළමයින් සඳහා නව මෝස්තර සහිත ඇඳුම් නිර්මාණය කිරීම ය.
(3) පලතුරු යුෂ භාවිත කර සිසිල් බීම පැකට් සකස් කිරීම ය.
(4) දේශීය ආහාර රසවත් කිරීමට ගත හැකි තුනපහ කුඩු පැකට් සකස් කිරීම ය.

13. වර්තමාන ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය ඔස්සේ පාඨමාලා හැදෑරීම බහුල වශයෙන් දක්නට හැකිය. මෙම නවෝත්පාදනයට පදනම් වූ ප්‍රධාන මූලාශ්‍රය වන්නේ
(1) වෙළෙඳපොළ වෙනස්වීම් ය.
(2) ක්‍රියාවලි අවශ්‍යතා ය.
(3) ප්‍රජා පරිසරය හා ජීවන රටාවේ සිදු වූ වෙනස්වීම් ය.
(4) සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස්වීම ය.

14. ස්වභාවික පරිසරය තුළින් ලබා ගන්නා සම්පත් වෙනසකට ලක් නොකර, ඒ ආකාරයෙන් ම ප්‍රයෝජනයට ගැනීම අයත් වන්නේ
(1) ද්විතීයික අංශයට ය. (2) නිෂ්පාදන අංශයට ය.
(3) තෘතීයික අංශයට ය. (4) ප්‍රාථමික අංශයට ය.

15. සමන් පෞද්ගලික වෘත්තීය අධ්‍යාපන ආයතනයක හිමිකරුවෙකි. ඔහු පරිගණක තාක්ෂණය සම්බන්ධ එක් අවුරුදු පාඨමාලාවක් හඳුන්වාදීමට අපේක්ෂා කරයි. මෙය
(1) පවතින සේවාවක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමකි.
(2) පවතින සේවාවක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමකි.
(3) නව සේවාවක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමකි.
(4) නව සේවාවක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමකි.

16. ශ්‍රී ලංකා ආර්ථිකයේ ද්විතීයික අංශයට අයත් ව්‍යාපාරයක් වන්නේ
(1) ප්‍රවාහනය ය. (2) ඉදිකිරීම ය.
(3) මසුන් ඇල්ලීම ය. (4) ගොවිතැන් කිරීම ය.

[තුන්වැනි පිටුව බලන්න.

17. එක්තරා බැංකුවක් විශ්‍රාමිකයින් සඳහා විශේෂිත බැංකු ගිණුමක් හඳුන්වා දුන් පසු, අනෙක් බැංකු විසින් ද එය අනුකරණය කර ඇත. මෙය
(1) ජනමාධ්‍ය මගින් ව්‍යාපාර අදහස් මතුවීමක් ය.
(2) සැපයුම්කරුවන් ඇසුරින් ව්‍යාපාර අදහස් මතුවීමක් ය.
(3) වෙළෙඳපොළ සමීක්ෂණය තුළින් ව්‍යාපාර අදහස් මතුවීමක් ය.
(4) තරගකාරීත්වය අධ්‍යයනය තුළින් ව්‍යාපාර අදහස් මතුවීමක් ය.

18. සිංහරාජ වනාන්තරය කේන්ද්‍රකොටගෙන සමන් සංචාරක නිකේතනයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඔහුගේ මෙම ව්‍යාපාර අදහස ඇතිවීම සඳහා බලපෑම් ඇති **නොකරන** ලද්දේ
(1) ස්වාභාවික සම්පත් ය. (2) ස්වාභාවික වනාන්තර ය.
(3) සත්ත්ව සම්පත ය. (4) සංස්කෘතික සම්පත් ය.

19. ඉහළ වගකීම, සීමිත කාලය සහ අවිනිශ්චිත අනාගතය වැනි සාධක ව්‍යවසායකත්වයේ දී සලකනු ලබන්නේ
(1) පාරිසරික සාධක ලෙස ය. (2) අභියෝගාත්මක සාධක ලෙස ය.
(3) නිෂ්පාදන සාධක ලෙස ය. (4) අභ්‍යන්තර සාධක ලෙස ය.

20. ව්‍යාපාරයක ආසන්න පරිසරයේ බලවේගයක් වන්නේ
(1) අයිතිකරුවන් ය. (2) තරගකරුවන් ය.
(3) කළමනාකරුවන් ය. (4) විදේශීය ආයෝජකයන් ය.

21. ව්‍යාපාරික අදහසක් ජනනය වීමට ව්‍යවසායකයකු තුළ තිබිය යුතු මූලික අවශ්‍යතාව කුමක් ද?
(1) උනන්දුව හා කැපවීම (2) හැකියාව හා කැමැත්ත
(3) කැමැත්ත හා නිර්මාණශීලීත්වය (4) නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය

22. ව්‍යවසායකයකුට විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කර, තම ව්‍යාපාරය සඳහා හොඳ සේවකයකු බඳවා ගැනීමට ඇති හැකියාව සලකනු ලබන්නේ
(1) මානව කුසලතාවයක් ලෙස ය. (2) සංකල්පනාත්මක කුසලතාවයක් ලෙස ය.
(3) උපදේශන කුසලතාවයක් ලෙස ය. (4) තාක්ෂණික කුසලතාවයක් ලෙස ය.

23. අත් පා හිරිවැටීම පාලනය කරනු ලබන සරල සම්භාහන උපකරණයක් නිපදවීමට කමල් අදහස් කරයි. ඒ සඳහා වඩාත් අවශ්‍ය ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ
(1) නිර්මාණශීලීත්ව ය. (2) කැපවීම ය.
(3) නායකත්වය ය. (4) දැක්ම ය.

24. ව්‍යවසායකත්ව සංස්කෘතියක් තුළින් ඕනෑම රටකට ඉහළ ආර්ථික වර්ධනයක් ලබා ගත හැකිය. ආර්ථික වර්ධනයක් ඇති වීමට නම් එම ආර්ථිකය තුළ
(1) සේවක සුබසාධනය ඉහළ මට්ටමක පවත්වා ගත යුතු ය.
(2) නිෂ්පාදනය කරන්නා වූ භාණ්ඩ හා සේවා ප්‍රමාණය වර්ධනය කළ යුතු ය.
(3) සියලු ම මානව හා මානව නොවන සම්පත් භාවිත කළ යුතු ය.
(4) සියලු කටයුතු රටේ පවතින ආකල්ප, විශ්වාස හා චාරිත්‍ර වාරිත්‍රවලට අනුව කළ යුතු ය.

25. ව්‍යවසායකයෙකු ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී ඔහු ආචාර ධර්ම පද්ධතියකට අනුකූලව කටයුතු කළ යුතු ය. මෙහි දී ප්‍රමුඛතාවය දිය යුතු වන්නේ
(1) සැපයුම්කරුවන්ට ය. (2) පාරිභෝගිකයන්ට ය.
(3) තරගකරුවන්ට ය. (4) සේවකයින්ට ය.

26. ව්‍යවසායකත්ව සංස්කෘතියක වෙසෙන පුද්ගලයෙකුගේ ගති ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?
(1) නිර්මාණශීලී හැකියාව (2) අවදානම් දැරීමේ හැකියාව
(3) සුභවාදීව සිතීම (4) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම

27. ඉහළ අධ්‍යාපනයක් ලැබීම තුළින් කාන්තාවන් ව්‍යාපාර ආරම්භ කිරීමට පෙළඹේ. මෙයට මූලික හේතුව වන්නේ
(1) මෘදු ගුණයයි. (2) කරුණාවන්ත බවයි.
(3) ස්වාධීන බවයි. (4) කැපවීමයි.

28. සහන් තම ව්‍යාපාරය සඳහා සීමිත සම්පත් කාර්යක්ෂමව භාවිත කරයි. සහන් මේ තුළින් ඉටුකරනු ලබන්නේ
(1) ආර්ථික වගකීමකි. (2) නීතිමය වගකීමකි.
(3) සදාචාරාත්මක වගකීමකි. (4) පරාර්ථකාමී වගකීමකි.

29. ආකර්ශනීය ආයෝජන අදහසක මූලික ලක්ෂණයක් වන්නේ
(1) අවදානමට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් තිබීම ය. (2) ඉල්ලුමට ප්‍රමාණවත් සැපයුමක් තිබීම ය.
(3) ප්‍රමාණවත් ගනුදෙනුකරුවන් පිරිසක් සිටීම ය. (4) ප්‍රමාණවත් තරගකරුවන් පිරිසක් සිටීම ය.

[හතරවැනි පිටුව බලන්න.

30. ශ්‍රී ලංකාවේ පවතින සෑම පොදු අංශයේ ව්‍යාපාරයක් ම
(1) ලාභ ලබයි. (2) රජය සතුයි.
(3) සේවා පමණක් සපයයි. (4) සුබසාධන කටයුතු පමණක් කරයි.

31. කේවල ස්වාමි ව්‍යාපාරයක් සඳහා 'ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය' ලබා දෙන්නේ
(1) දිස්ත්‍රික් ලේකම් විසින් ය. (2) ප්‍රාදේශීය ලේකම් විසින් ය.
(3) නගර සභාවේ නගරාධිපති විසින් ය. (4) ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ය.

32. නාරද තම ව්‍යාපාරය සඳහා තමා විසින් ම මුදල් යෙදවීමටත්, වගකීම තම ආයෝජන මුදලට පමණක් සීමා කිරීමටත්, ව්‍යාපාර කටයුතු සඳහා නීතිය ඉදිරියේ තම පුද්ගලික නමින් පෙනී නොසිටීමටත් අපේක්ෂා කරයි. ඔහුගේ අපේක්ෂා ඉටුකර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(1) කේවල ස්වාමි ව්‍යාපාරය (2) හවුල් ව්‍යාපාරය
(3) සීමාසහිත පෞද්ගලික සමාගම (4) සීමාසහිත පොදු සමාගම

33. ව්‍යාපාරයක් සඳහා අලෙවි සැලැස්මක් සකස් කිරීමේ පළමු පියවර වන්නේ
(1) වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීමයි.
(2) විකුණුම් ආදායම පුරෝකථනය කිරීමයි.
(3) අපේක්ෂිත ඒකක විකුණුම් මිල තීරණය කිරීමයි.
(4) වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ප්‍රමාණය ගණනය කිරීමයි.

34. නිෂ්පාදන ක්‍රියාවලියක දී යෙදවුමකට හා නිමැවුමකට නිදසුන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) තේ - සීනි (2) ලී - මේසය
(3) ගඩොල් - මැටි (4) උළු - සිමෙන්ති

35. ව්‍යාපාරයක නිෂ්පාදන සැලැස්මෙහි ඇතුළත් ස්ථාවර වත්කමක් වන්නේ
(1) භාණ්ඩ බෙදා හැරීමට භාවිත කරන වෑන් රථයයි.
(2) වෙළෙඳසැලෙහි භාවිත කරන ලී බඩුයි.
(3) කර්මාන්ත ශාලාවෙහි භාවිත කරන යන්ත්‍රෝපකරණයි.
(4) නිෂ්පාදනය සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය තොගයයි.

36. අපේක්ෂිත ව්‍යාපාරයක ඇස්තමේන්තු ගත රක්ෂණ ගාස්තු, දුරකථන ගාස්තු හා ලිපිද්‍රව්‍ය වියදම් ඇතුළත් කරනු ලබන්නේ
(1) නිෂ්පාදන සැලැස්මෙහි ය. (2) අලෙවි සැලැස්මෙහි ය.
(3) මූල්‍ය සැලැස්මෙහි ය. (4) පරිපාලන සැලැස්මෙහි ය.

37. සහන්ගේ යෝජිත භාණ්ඩ මිලදී ගෙන බෙදා හැරීමේ ව්‍යාපාරයේ ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීම සඳහා වූ වියදම සලකනු ලබන්නේ
(1) පරිපාලන වියදමක් ලෙස ය. (2) මූල්‍ය වියදමක් ලෙස ය.
(3) බෙදාහැරීමේ වියදමක් ලෙස ය. (4) ආරම්භ කිරීමට පෙර වියදමක් ලෙස ය.

38. නව නිෂ්පාදිතයක් වෙළෙඳපොළට හඳුන්වාදීමට අපේක්ෂා කරන ව්‍යවසායකයෙකුට අරමුදල් සම්පාදනය කරන්නෙකු විසින් විශේෂයෙන් අවධානය යොමු කළ යුත්තේ එම ව්‍යාපාරයේ
(1) අලෙවි සැලැස්මට ය. (2) නිෂ්පාදන සැලැස්මට ය.
(3) පරිපාලන සැලැස්මට ය. (4) මූල්‍ය සැලැස්මට ය.

39. ව්‍යාපාරයක මූල්‍ය සැලැස්මෙන් අනාවරණය **නොවන** තොරතුරක් වන්නේ
(1) මූල්‍ය කළමනාකරුගේ කාර්යභාරය ය. (2) කාරක ප්‍රාග්ධනය ය.
(3) මුළු ස්ථාවර වත්කම් ය. (4) අපේක්ෂිත ව්‍යාපාරික ප්‍රතිඵලය ය.

40. මල්කි මල් පෝච්චි සකස්කර ඒවා විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. පළමු මාසය සඳහා වූ ඇස්තමේන්තුගත පිරිවැය පහත දැක්වේ.

	රු.
අමුද්‍රව්‍ය පිරිවැය	38 000
ශ්‍රම පිරිවැය	42 000
වෙනත් නිෂ්පාදන වියදම්	7 000
අලෙවි කිරීමේ වියදම්	8 000
ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ වියදම	5 000

මල්කිගේ ව්‍යාපාරයේ පළමු මාසය සඳහා අපේක්ෂිත මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ
(1) රු. 80 000 කි. (2) රු. 87 000 කි. (3) රු. 95 000 කි. (4) රු. 100 000 කි.

[පස්වැනි පිටුව බලන්න.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

ව්‍යවසායකත්ව අධ්‍යයනය	I, II
முயற்சியாண்மைக் கற்கை	I, II
Entrepreneurship Studies	I, II

ව්‍යවසායකත්ව අධ්‍යයනය II

✻ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාසල හැරයාමෙන් පසු අශානි කාන්තා අත්බෑග් සැකසීමේ පාඨමාලාවක් හදාරන ලද්දේ ඇයගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අපේක්ෂාවෙනි. කර්මාන්තශාලාවක සේවය කළ ඇගේ මවගේ අවිවේකී බව නිසා ම ඇය වෙනත් කෙනෙකු යටතේ රැකියාවක් නොකිරීමට තීරණය කර සිටියා ය. තමා සමඟ සේවය කරන කාන්තාවන් නිතරම නවතම විලාසිතා අනුව ඔවුන්ගේ අත් බෑගය වෙනස් කරන බව අශානිගේ මව ඇය සමඟ පවසා ඇත.

අශානි කාන්තා අත්බෑග් සැකසීමේ ව්‍යාපාරයක් ආරම්භ කර, එය දිනෙක ජාත්‍යන්තර වෙළෙඳපොළ දක්වා ව්‍යාප්ත කිරීමටත් අදිටන් කළා ය. රජය විසින් සුළු පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම සඳහා හඳුන්වා දී ඇති ණය යෝජනා ක්‍රමය යටතේ රු. 500 000 ක බැංකු ණයක් 6% වාර්ෂික පොළී අනුපාතයක් යටතේ ලබා ගැනීමටත් තම දෙමව්පියන්ගෙන් ලැබූ රු. 200 000ක් ව්‍යාපාරය සඳහා යෙදීමටත් ඇය බලාපොරොත්තු වේ. අශානි තම යෝජිත ව්‍යාපාරය සඳහා පහත සඳහන් දෑ කිරීමට ද අපේක්ෂා කරයි.

- රු. 75 000 ක් බැගින් වූ මැෂින් දෙකක් මිලදී ගැනීම
- මාසිකව රු. 25 000 ක් වූ ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම
- බෑග් සැකසීම සඳහා සේවකයින් දෙදෙනෙකු බඳවා ගැනීම හා එක් අයෙකුට රු. 40 000 බැගින් මාසික වේතනයක් ලබාදීම
- රු. 100 000 ක ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම
- සිය නිෂ්පාදිත අත්පත්‍රිකා හා සමාජ මාධ්‍ය භාවිත කර ප්‍රචාරණය කිරීම හා අන්තර්ජාලය ඔස්සේ ඇණවුම් භාරගෙන විකිණීම
- තොරතුරු තාක්ෂණය පිළිබඳ හොඳ දැනුමක් ඇති තම සොයුරු භානුකගේ සේවය ලබාගෙන, ඔහුට රු. 30 000 ක මාසික වේතනයක් ගෙවීම

(i) අශානිට මෙම ව්‍යාපාරික අදහස ඇතිවීමට හේතු වූ කරුණු **දෙකක්** ලියන්න.

(ii) අශානිට පහත සඳහන් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ පවතින බව සිද්ධිය ඇසුරින් සනාථ කරන්න.
(අ) ස්වාධීනත්වය (ආ) අනාගත දැක්ම

(iii) අශානිගේ යෝජිත ව්‍යාපාරයේ පවතින ශක්තියක් හා අවස්ථාවක් සඳහන් කරන්න.

(iv) අශානි තම නිෂ්පාදිත වෙළෙඳපොළට හඳුන්වා දීමේදී භාවිත කිරීමට අපේක්ෂිත ප්‍රවර්ධන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(v) අශානි තම ව්‍යාපාරය තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර **දෙකක්** ලියන්න.

- අශානිගේ ව්‍යාපාර සැලසුමෙන් ලබාගත් තොරතුරු කිහිපයක් පහත දී ඇත.

අපේක්ෂිත වියදම්

	රු.
ව්‍යාපාර සැලසුම සකස් කිරීම සඳහා	5 000
ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ගාස්තු	2 500
මාසික අමුද්‍රව්‍ය හා අනිකුත් නිෂ්පාදන ද්‍රව්‍ය මිලදී ගැනීම	125 000
මාසික ප්‍රචාරණ හා විකුණුම් වියදම්	45 000

අපේක්ෂිත ආදායම

මාසික විකුණුම් ආදායම	450 000

අවශ්‍ය වන්නේ: අශානිගේ යෝජිත ව්‍යාපාරයේ පහත සඳහන් දෑ දැක්වීම

(vi) අයිතිකරුගේ ආයෝජනය හා මුළු ස්ථාවර වත්කම්

(vii) ආරම්භ කිරීමට පෙර වියදම්

(viii) මුළු මුදල් ගලා ඒම්

(ix) අලෙවි වියදම් හා මූල්‍ය වියදම්

(x) පළමු මාසයේ මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා යොදා ගන්නා වියදම් **දෙකක්** වටිනාකම් සහිතව

(ලකුණු 02 × 10 = 20 යි)

[හයවැනි පිටුව බලන්න.

2. (i) 'ව්‍යවසායකයා' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර පවතින වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

(iii) 'අභ්‍යන්තරික ව්‍යවසායකයා' යන්න නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

(iv) සුදාර නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඔහුගේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය සම්පත් නිෂ්පාදන සාධක අනුව වර්ග කර, ඒවා සඳහා නිදසුන බැගින් සපයන්න.

(v) රටක කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළින් බිහිවන ව්‍යාපාරික අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

3. (i) ව්‍යවසායකයෙකුට හිමිවන සාමාජයීය ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(ii) ව්‍යවසායකයෙකුට නායකයා සහ කළමනාකරු යන භූමිකාවලදී ඉටුකිරීමට සිදුවන කාර්යය **එක** බැගින් සඳහන් කරන්න.

(iii) වර්තමානයේ දී ශ්‍රී ලාංකික ව්‍යවසායකයෙකුට සමාජයීය සුභසාධනය සඳහා දායක විය හැකි අවස්ථා සඳහා නිදසුන් **දෙකක්** දක්වන්න.

(iv) රටක දේශීය ආර්ථිකය වර්ධනය කිරීම සඳහා ව්‍යවසායකයෙකුට දායක විය හැකි ආකාර **දෙකක්** ලියන්න.

(v) රැකියා නියුක්තිකයෙකු වීමට වඩා ව්‍යවසායකයෙකු වීම තුළින් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

4. (i) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ව්‍යවසායකයෙකු විසින් ගත යුතු වැදගත් තීරණ **දෙකක්** සඳහන් කරන්න.

(ii) සමන් රෙදි සෝදන කුඩු වර්ගයක් නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. මෙහි දී සමන් විසින් සලකා බැලිය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

(iii) වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදිතයක සාර්ථක අලෙවියක් සඳහා බලපාන කරුණු **දෙකක්** ලියන්න.

(iv) ව්‍යාපාර **දෙකක්** නම් කර, ඒ සඳහා වඩාත් ම උචිත ස්ථානය සහ පාරිභෝගික කොටස සඳහන් කරන්න.

(v) ජනමාධ්‍ය මගින් නව ව්‍යාපාර අදහස් ජනිත වීම සුලභ තත්ත්වයකි. මේ සඳහා නිදසුන් **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

5. (i) කේවල ස්වාමි ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක පොදු ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) හවුල් ගිවිසුමකින් විසඳාගත හැකි හවුල් ව්‍යාපාරයක ඇති වන ප්‍රායෝගික ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(iii) සීමාසහිත පෞද්ගලික සමාගමකට නාමයක් තෝරා ගැනීමේ දී 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව භාවිත **නොකළ** යුතු නාම **දෙකක්** ලියන්න.

(iv) සංස්ථාපිත සමාගම්වල දැකිය හැකි මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න.

(v) කේවල ස්වාමි ව්‍යාපාරයක හා සීමාසහිත පෞද්ගලික සමාගමක පහත සඳහන් දෑ පිළිබඳ පිළිවෙළින් ලියන්න.

(අ) අවම සාමාජික සංඛ්‍යාව

(ආ) අයිතිකරුගේ වගකීම

(ලකුණු 02 × 5 = 10 යි)

6. (i) ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව දිරිගැන්වීම කරනු ලබන ආයතන **දෙකක්** නම් කරන්න.

(ii) ව්‍යවසායකත්වයට එරෙහි වන සමාජයීය සාධක **දෙකක්** සඳහන් කරන්න.

(iii) කාන්තා ව්‍යවසායකත්වයට පවතින බාධක **දෙකක්** සඳහන් කරන්න.

(iv) රටක ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීමේ අවශ්‍යතාව තහවුරු කරන කරුණු **හතරක්** ලියන්න.

(v) රටක ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමේ දී එහි ශ්‍රම බලකායට රැකියා සම්පාදනය කිරීම සඳහා පවතින විරැකියාවේ ස්වභාවය අධ්‍යයනය කළ යුතු ය. ශ්‍රී ලංකාවේ පවතින විරැකියාවේ ස්වභාවයන් **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

[හත්වැනි පිටුව බලන්න.

7\. (i) වෙළෙඳපොළ විශ්ලේෂණයක දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පාසලක පරිපාලන සැලැස්මේ ඇතුළත් වන තනතුරු **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) සුපුන්ගේ අපේක්ෂිත ව්‍යාපාරයේ පළමු මාසය තුළ මුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ ඇස්තමේන්තුව පහත දැක්වේ.

	රු.
අයිතිකරුගේ යෙදවීම්	200 000
අපේක්ෂිත අලෙවි ආදායම	300 000
වෙළෙඳ භාණ්ඩ මිල දී ගැනීම	150 000
ගොඩනැගිලි කුලිය ගෙවීම	25 000
වැටුප් හා අනෙකුත් වියදම්	75 000
වෙළෙඳසැලට ලී බඩු මිල දී ගැනීම	200 000

අවශ්‍ය වන්නේ:

සුපුන්ගේ යෝජිත ව්‍යාපාරයේ පළමු මාසය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර, මුළු මුදල් ගලා ඒම්, මුළු මුදල් ගලා යාම් සහ කාලපරිච්ඡේදය අවසානයේ මුදල් ශේෂය දැක්වීම

(ලකුණු 06 යි)

(මුළු ලකුණු 10 යි)

***

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය

ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) ලකුණු 40

II පත්‍රය

1. ප්‍රශ්නය	ලකුණු 20	
2. ප්‍රශ්නය	ලකුණු 10	ප්‍රශ්න 04 කට ලකුණු 40
3. ප්‍රශ්නය	ලකුණු 10	
4. ප්‍රශ්නය	ලකුණු 10	
5. ප්‍රශ්නය	ලකුණු 10	
6. ප්‍රශ්නය	ලකුණු 10	
7. ප්‍රශ්නය	ලකුණු 10	

I පත්‍රය	ලකුණු 40
II පත්‍රය	ලකුණු 60
අවසාන	ලකුණු 100

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) .... √ △ $\frac{4}{5}$

(ii) .... √ △ $\frac{3}{5}$

(iii) .... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ ➡ එකතුව □ $\frac{10}{15}$

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත්**

පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம்: **63**

විෂයය / பாடம்: **ව්‍යවසායකත්ව අධ්‍යයනය**

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.
01.	2	11.	3	21.	3	31.	2
02.	3	12.	1	22.	4	32.	3
03.	3	13.	3	23.	1	33.	1
04.	2	14.	4	24.	2	34.	2
05.	4	15.	1	25.	2	35.	3
06.	3	16.	2	26.	4	36.	4
07.	2	17.	4	27.	3	37.	4
08.	4	18.	4	28.	1	38.	4
09.	2	19.	2	29.	1	39.	1
10.	4	20.	2	30.	2	40.	2

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை	25 / 40
I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி	25 / 40

(v)

1. සේවා නියුක්තියට දායක වීම මගින් / රැකියා සැපයීම මගින්
2. විදේශ විනිමය ඉපයීම මගින්
3. ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩු කිරීමට දායක වීම මගින්
4. වෙළෙඳපොළ තුළ භාණ්ඩ සුලභ කිරීම මගින්
5. රටේ නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක වීම මගින්
6. දේශීය සම්පත් භාවිතයට ගැනීම මගින්

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(vi)

අයිතිකරුගේ ආයෝජනය :- රු. 200 000 **(ලකුණු 01යි)**

මුළු ස්ථාවර වත්කම් :- 1. මැෂින් රු. 150 000 $\left(\frac{1}{2}\right)$

2. ලැප්ටොප් පරිගණකය රු. 100 000 $\left(\frac{1}{2}\right)$

රු. 250 000

හෝ

මුළු ස්ථාවර වත්කම් = රු. 250 000

(ලකුණු 01යි)

(මුළු ලකුණු 02යි)

(vii)

ආරම්භ කිරීමට පෙර වියදම් රු. 7500 **(ලකුණු 02යි)**

හෝ

ආරම්භ කිරීමට පෙර වියදම්

ව්‍යාපාර සැලැස්ම සැකසීමට	රු. 5000	(01)
ව්‍යාපාරය ලියාපදිංචියට	රු. 2500	(01)
	රු. 7500	

(viii)

මුළු මුදල් ගලා ඒම = රු. 1150000 **(නිවැරදි පිළිතුරට ලකුණු 02යි)**

හෝ

මුළු මුදල් ගලා ඒම :- අයිතිකරු යෙදවුම් / අශානි	රු. 200 000	$\left(\frac{1}{2}\right)$
බැංකු ණය	රු. 500 000	$\left(\frac{1}{2}\right)$
මාසික විකුණුම් ආදායම	රු. 450 000	$\left(\frac{1}{2}\right)$
	රු. 1150 000	$\left(\frac{1}{2}\right)$

(අයිතම් තුනට ලකුණු $\frac{1}{2}$ බැගින් ලකුණු $1\frac{1}{2}$ යි. අවසාන එකතුවට ලකුණු $\frac{1}{2}$)

(මුළු ලකුණු 02යි)

(ix)

අලෙවි වියදම් - ප්‍රචාරණ හා විකුණුම් වියදම් - රු. 45 000

මූල්‍ය වියදම් - ණය පොලී - රු. 2 500

(වටිනාකම් සහිතව හෝ රහිතව කරුණු දෙකට ලකුණු 02යි)

(x)

බෑග් සැකසීමේ නිරත සේවකයින්ට වැටුප් රු. 80 000

අමුද්‍රව්‍ය හා අනෙකුත් නිෂ්පාදන ද්‍රව්‍ය වියදම් රු. 125 000

(වටිනාකම සහිත පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

(මුළු ලකුණු 02 × 10 = 20යි)

2. (i) 'ව්‍යවසායකයා' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර පවතින වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

(iii) 'අභ්‍යන්තරික ව්‍යවසායකයා' යන්න නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

(iv) සුදාර නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඔහුගේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය සම්පත් නිෂ්පාදන සාධක අනුව වර්ග කර, ඒවා සඳහා නිදසුන බැගින් සපයන්න.

(v) රටක කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළින් බිහිවන ව්‍යාපාරික අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

(02)

(i)

- පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින් නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදන බිහි කිරීමේ නිරතවන්නා ව්‍යවසායකයා වේ.
- සැලසුම් කිරීම හා නිවැරදි තීරණ ගැනීම ඔස්සේ ආර්ථික හා සමාජයීය පරිවර්තනයක් සිදු කිරීම සඳහා සැලකිය යුතු වෙනසක් සිදු කරන්නා වූ පුද්ගලයෙකි.
- ව්‍යාපාර අදහස් සංවර්ධනය කිරීමට අවශ්‍ය සම්පත් සපයාගෙන එය යෙදවීමේ ප්‍රතිඵලයක් ලෙස නව භාණ්ඩ හා සේවා, නව ක්‍රියාවලී හා නව ව්‍යාපාර උත්පාදනය කරන්නා ය.

(අදහස පැහැදිලි වන පිළිතුරකට ලකුණු 02යි)

(ii)

අවශ්‍යතා	වුවමනා
1. මූලිකව පැන නගියි.	1. දෙවනුව / ද්විතීකව පැන නගියි.
2. සීමිතය.	2. අසීමිතය.
3. සියලු දෙනාටම පොදු ය.	3. විවිධ වේ.
4. උප්පත්තියත් සමග ම ඇති වේ. / ව්‍යාපාරකයින්ට නිර්මාණය කළ නොහැකි ය.	4. ව්‍යාපාරකයින්ට නිර්මාණය කළ හැකි ය.

(ගැළපෙන වෙනස්කම් එකකට ලකුණු 01 බැගින් වෙනස්කම් දෙකකට ලකුණු 02යි)

(iii)

ආයතන තුළ ඉහළ තනතුරු දරන එමෙන් ම ව්‍යවසායකත්ව ගුණාංග ඇති පුද්ගලයෝ අභ්‍යන්තර ව්‍යවසායකයෝ වෙති.

නිදසුන් 1. ඵලදායිතා සම්මානය දිනාගත් විදුහල්වල ප්‍රධානීන්
2. ගුණත්ව සම්මානය හිමිකරගත් රජයේ ආයතනවල ප්‍රධානීන්

(පැහැදිළි කිරීමට ලකුණු 01යි. පිළිගත හැකි නිවැරදි නිදසුනට ලකුණු 01යි)

(iv)

1. භූමිය - අමුද්‍රව්‍ය, ඉඩම්, පස, වනාන්තර, හිරු එළිය, වාතාශ්‍රය, අව්ව/ හිරු රශ්මිය
2. ශ්‍රමය - සේවකයින්ගේ ශ්‍රමය (ක්‍රියාකරුවන්ගේ ශ්‍රමය, අත් උදවුකරුවන්ගේ ශ්‍රමය)
3. ප්‍රාග්ධනය - මැෂින්, උපකරණ, ගොඩනැගිලි, මුදල්
4. ව්‍යවසායකත්වය - සුදාරගේ හැකියාවන්, දැනුම, ආකල්ප, කුශලතා

(නිෂ්පාදන සාධක හතර නම් කිරීමට ලකුණු 01යි. නිදසුන් එක බැගින් නම් කිරීමට ලකුණු 01යි)

(v)

1. නව තාක්ෂණය භාවිත කරමින් බිහි වී ඇති ව්‍යාපාර අවස්ථා (බීජ ඉසීමේ යන්ත්‍ර, පොහොර යෙදීමේ යන්ත්‍ර සහ උපකරණ වැනි)
2. කාබනික පොහොර යෙදූ එළවළු, පළතුරු, සහල් වර්ග, ධාන්‍ය වර්ග නිෂ්පාදනය කිරීම
3. සුළු අපනයන බෝග නිෂ්පාදනය කිරීම
4. අස්වැන්න කල් තබා ගැනීමට නව ක්‍රම සොයා ගැනීම
5. කෘෂි නිෂ්පාදන අපනයනය කිරීම
6. අස්වැන්න වැඩි කර ගැනීමට නව ක්‍රම සොයා ගැනීම

(පිළිගත හැකි පිළිතුරුකට ලකුණු 01 බැගින් පිළිතුරු දෙකකට ලකුණු 02යි)

(මුළු ලකුණු 02 × 5 = 10යි)

3. (i) ව්‍යවසායකයෙකුට හිමිවන සාමාජයීය ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(ii) ව්‍යවසායකයෙකුට නායකයා සහ කළමනාකරු යන භූමිකාවලදී ඉටුකිරීමට සිදුවන කාර්යය **එක** බැගින් සඳහන් කරන්න.

(iii) වර්තමානයේ දී ශ්‍රී ලාංකික ව්‍යවසායකයෙකුට සමාජයීය සුභසාධනය සඳහා දායක විය හැකි අවස්ථා සඳහා නිදසුන් **දෙකක්** දක්වන්න.

(iv) රටක දේශීය ආර්ථිකය වර්ධනය කිරීම සඳහා ව්‍යවසායකයෙකුට දායක විය හැකි ආකාර **දෙකක්** ලියන්න.

(v) රැකියා නියුක්තිකයෙකු වීමට වඩා ව්‍යවසායකයෙකු වීම තුළින් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 x 5 = 10 යි)

(03)

(i)
1. නායකත්වය හිමිවීම
2. කීර්ති ප්‍රශංසා හිමිවීම
3. පිළිගැනීම
4. ආත්ම තෘප්තියක් හිමිවීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(ii)

නායකයා
1. මානව සම්පත් මෙහෙයවීම
2. මානව සම්පත් උනන්දු කරවීම
3. මානව සම්පත්වලට අවශ්‍ය පරිදි බලපෑම් කිරීම

කළමනාකරු
1. සම්පත් නිසි පරිදි හැසිරවීම
2. ව්‍යාපාර සැලසුම් සැකසීම
3. සැලසුම්වලට අනුව කටයුතු සිදු වනවා දැයි සොයා බැලීම

(භූමිකා දෙක සඳහා කරුණු එක බැගින් දැක්වීමට ලකුණු 02යි)

(iii)
1. හදිසි ස්වාභාවික විපත්වලදී උපකාර කිරීම
2. නිවාස අහිමිවූවන්ට නිවාස ඉදිකර දීම
3. ආර්ථික අපහසුතා ඇති දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම
4. රජයේ සුබසාධන කටයුතු සඳහා උදවු කිරීම
5. රැකියා අවස්ථා ලබා දීම

(නිවැරදි කරුණු එකකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(iv)

1. දේශීය සම්පත් භාවිතයට ගැනීම / දේශීය සම්පත් උපයෝජනය කිරීම මගින්
2. නව භාණ්ඩ හා සේවා වෙළඳපොළට ඉදිරිපත් කිරීම මගින්
3. රැකියා අවස්ථා ජනනය/ බිහි කිරීම මගින්
4. විදේශ විනිමය ඉපයීම මගින්
5. ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු කිරීමට දායක වීම මගින්
6. රටේ නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක වීම මගින්
7. ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා සමාජයක් බිහි කිරීමට දායක වීම මගින්
8. ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීමට දායක වීම මගින්

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(v)
1. කැපවීම මත ආකර්ෂණීය ලාභයක් උපයා ගත හැකි වීම
2. වර්ධනය සඳහා උපරිම අවකාශයක් පැවතීම
3. ප්‍රයෝජනයට නොගත් හැකියාවලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම
4. කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම
5. සමාජ සුබසාධනය සඳහා දායක විය හැකි වීම

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(මුළු ලකුණු 02 × 5 = 10යි)

4. (i) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ව්‍යවසායකයෙකු විසින් ගත යුතු වැදගත් තීරණ **දෙකක්** සඳහන් කරන්න.
(ii) සමන් රෙදි සෝදන කුඩු වර්ගයක් නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. මෙහි දී සමන් විසින් සලකා බැලිය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න.
(iii) වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදිතයක සාර්ථක අලෙවියක් සඳහා බලපාන කරුණු **දෙකක්** ලියන්න.
(iv) ව්‍යාපාර **දෙකක්** නම් කර, ඒ සඳහා වඩාත් ම උචිත ස්ථානය සහ පාරිභෝගික කොටස සඳහන් කරන්න.
(v) ජනමාධ්‍ය මගින් නව ව්‍යාපාර අදහස් ජනිත වීම සුලභ තත්ත්වයකි. මේ සඳහා නිදසුන් **දෙකක්** දක්වන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

(04)

(i)

1. ඉපයීම ප්‍රමාණවත් ද ?
2. තරගයේ ස්වභාවය කෙබඳු ද ?
3. ඉලක්කගත පාරිභෝගිකයා කවු ද ?
4. ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේ ද ?
5. ව්‍යාපාරය පිහිටුවන ස්ථානය කෙබඳු ද ?

6. ව්‍යාපාරය සඳහා කෙතරම් කැපවිය හැකි ද ?
7. තනිව හෝ හවුල්ව ව්‍යාපාරය ආරම්භ කරනවා ද ?
8. ව්‍යාපාරය තුළින් සමාජයට කවර ප්‍රතිලාභ අත්කර දිය හැකි ද ?
9. ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය හෝ සේවාව කුමක් ද ?

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(ii)

1. අමුද්‍රව්‍ය සපයා ගන්නා ආකාරය
2. ශ්‍රමය සපයා ගන්නා ආකාරය
3. අරමුදල් සපයා ගන්නා ආකාරය
4. වෙළඳපොල ඉල්ලුමක් පවතී ද යන්න පිළිබඳව
5. යන්ත්‍ර සූත්‍ර, උපකරණ ආදිය සපයා ගැනීම සහ නඩත්තුව පිළිබඳව
6. තරගකරුවන් පිළිබඳව
7. නෛතික අවශ්‍යතා ඉටු කිරීම පිළිබඳව

(නිවැරදි කරුණු දෙකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

(iii)

1. නිෂ්පාදිතය
2. මිල
3. ස්ථානය
4. ප්‍රවර්ධනය

(නිවැරදි කරුණු දෙකකට ලකුණු 1 බැගින් ලකුණු 2යි)

(iv)

ලිපිද්‍රව්‍ය අලෙවිසැල	පාසලක් අසල	පාසල් ළමුන්	(ලකුණු 01)
ඔසුසල	රෝහලක් අසල	රෝගීන්	(ලකුණු 01)

(ව්‍යාපාරයක් නම් කර, උචිත ස්ථානය හා පාරිභෝගික කොටස නිවැරදිව නම් කිරීමට ලකුණු 01 බැගින් පිළිතුරු 2ක සඳහා ලකුණු 02යි)

(v)

1. සැපයුම්කරුවන් විමසීමේ දැන්වීම් වලට ප්‍රතිචාර ලෙස සැපයුම් ව්‍යාපාර ආරම්භ කිරීම
2. භාණ්ඩ තොග වශයෙන් අලෙවි කිරීමේ දැන්වීම් මත අලෙවි ව්‍යාපාර ඇති වීම
3. ව්‍යාපාරයකට හවුල්කරුවන් විමසීමේ දැන්වීම් මගින් හවුල් ව්‍යාපාර බිහිවීම

(නිවැරදි කරුණු දෙකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

(මුළු ලකුණු 02 × 5 = 10යි)

5. (i) කේවල ස්වාමි ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක පොදු ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) හවුල් ගිවිසුමකින් විසඳාගත හැකි හවුල් ව්‍යාපාරයක ඇති වන ප්‍රායෝගික ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(iii) සීමාසහිත පෞද්ගලික සමාගමකට නාමයක් තෝරා ගැනීමේ දී 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව භාවිත **නොකළ** යුතු නාම **දෙකක්** ලියන්න.

(iv) සංස්ථාපිත සමාගම්වල දැකිය හැකි මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න.

(v) කේවල ස්වාමි ව්‍යාපාරයක හා සීමාසහිත පෞද්ගලික සමාගමක පහත සඳහන් දෑ පිළිබඳ පිළිවෙළින් ලියන්න.

(අ) අවම සාමාජික සංඛ්‍යාව

(ආ) අයිතිකරුගේ වගකීම (ලකුණු 02 × 5 = 10 යි)

(05)

(i)

1. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
2. වගකීම අසීමිත වීම
3. ලියාපදිංචිය අනිවාර්ය නොවීම
4. නෛතික පුද්ගලභාවයක් නොමැති වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(ii)

1. හවුල්කරුවන් ප්‍රාග්ධනය සපයන ආකාරය
2. හවුල්කරුවන් ලාභ පාඩු බෙදා ගන්නා ආකාරය
3. හවුල්කරුවන් ව්‍යාපාරයේ කටයුතුවලට සම්බන්ධවන ආකාරය
4. හවුල්කරුවන් වැටුප් ලබා ගන්නා ආකාරය
5. හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව
6. ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා පොලී අයකර ගැනීම
7. හවුල් ව්‍යාපාරයේ කටයුතු අවසන් කරන ආකාරය පිළිබඳව

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(iii)

1. ශ්‍රී ලංකා
2. ජනාධිපති
3. රාජ්‍ය
4. පවතින සමාගමක නාමයක් හෝ අනුරූප නාමයක් භාවිත කළ නොහැකි වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(iv)

1. අඛණ්ඩ පැවැත්මක් තිබීම

2. නෛතික පුද්ගලභාවයක් හිමිවීම
3. කොටස්කරුවන්ගේ වගකීම සීමාසහිත වීම
4. කොටස් මගින් ප්‍රාග්ධනය රැස් කර ගැනීම
5. කළමනාකරණ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු කිරීම
6. සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ආයතනයක් වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02යි)

(v)

	කේවල ස්වාමි ව්‍යාපාර	සීමාසහිත පෞද්ගලික සමාගම්
අවම සාමාජික සංඛ්‍යාව	1 යි	1 යි
අයිතිකරුවන්ගේ වගකීම	අසීමිතයි	සීමිතයි

(එක් කරුණකට ලකුණු $\frac{1}{2}$ බැගින් කරුණු හතරකට ලකුණු 02යි)

(මුළු ලකුණු 02 × 5 = 10යි)

6. (i) ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව දිරිගැන්වීම කරනු ලබන ආයතන **දෙකක්** නම් කරන්න.
(ii) ව්‍යවසායකත්වයට එරෙහි වන සමාජයීය සාධක **දෙකක්** සඳහන් කරන්න.
(iii) කාන්තා ව්‍යවසායකත්වයට පවතින බාධක **දෙකක්** සඳහන් කරන්න.
(iv) රටක ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීමේ අවශ්‍යතාව තහවුරු කරන කරුණු **හතරක්** ලියන්න.
(v) රටක ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමේ දී එහි ශ්‍රම බලකායට රැකියා සම්පාදනය කිරීම සඳහා පවතින විරැකියාවේ ස්වභාවය අධ්‍යයනය කළ යුතු ය. ශ්‍රී ලංකාවේ පවතින විරැකියාවේ ස්වභාවයන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 × 5 = 10 යි)

(06)

(i)

1. කාර්මික සංවර්ධන මණ්ඩලය
2. කාර්මික තාක්ෂණ ආයතනය
3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
4. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
5. සියලු ම දේශීය වාණිජ බැංකු
6. වාණිජ බැංකු නොවන වෙනත් මූල්‍ය ආයතනය
7. DFCC බැංකුව
8. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
9. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(නිවැරදි එක් ආයතනයකට ලකුණු 01 බැගින් ආයතන දෙකකට ලකුණු 02 යි)

(ii)

1. වැටුප් ලබන රැකියාවකට ඇති ඉහළ පිළිගැනීම
2. අධ්‍යාපනය තුළින් දිරිමත් කිරීමක් සිදු නොවීම
3. රාජ්‍ය දිරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම
4. යැපුම් මානසිකත්වයෙන් යුක්ත වීම
5. අවදානම් හා අභියෝග භාර ගැනීමට ඇති අකමැත්ත

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02 යි)

(iii)

1. ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතාවය
2. කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රමාණවත් නොවීම
3. සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අකැමැත්ත
4. කාන්තාවන්ගේ ස්වාධීනත්වය සමාජය තුළ තවමත් ස්ථාපිත නොවීම
5. කාන්තාවන්ට ගෘහ ජීවිතයට මුල්තැන දීමට සිදුවන නිසා ව්‍යාපාර කටයුතු අතපසු වීම
6. පෞද්ගලික ජීවිතය හා ගෘහ ජීවිතය සමබරව පවත්වාගෙන යාමට ඇති අභියෝගය

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02 යි)

(iv)

1. විරැකියාවට විසඳුමක් ලබාදීම
2. ආර්ථික වර්ධනයක් ළගා කර ගත යුතු වීම
3. භාවිතයට නොගත් සම්පත් සුලභ ව පැවතීම
4. නව රැකියා නිර්මාණය කරන්නන් බිහි කර ගත යුතු වීම
5. ආදායම් බෙදී යාමේ විෂයතාවය අවම කර ගත යුතු වීම

(එක් කරුණකට ලකුණු $\frac{1}{2}$ බැගින් කරුණු හතරකට ලකුණු 02 යි)

(v)

1. උගත් කාන්තාවන් අතර විරැකියාව ඉහළ මට්ටමක පැවතීම
2. වයස අවුරුදු 30 ට අඩු තරුණයින් අතර විරැකියාව ඉහළ ප්‍රතිශතයක් ගැනීම
3. නූගත් ශ්‍රමිකයින් වඩා උගත් ශ්‍රමිකයන් අතර විරැකියාව වැඩි වීම
4. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් රැකියා සඳහා විදේශ ගත වීම

(පිළිගත හැකි නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් පිළිතුරු දෙකකට ලකුණු 02 යි)

(මුළු ලකුණු 02 × 5 = 10යි)

7. (i) වෙළෙඳපොළ විශ්ලේෂණයක දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පාසලක පරිපාලන සැලැස්මේ ඇතුළත් වන තනතුරු **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) සුපුන්ගේ අපේක්ෂිත ව්‍යාපාරයේ පළමු මාසය තුළ මුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ ඇස්තමේන්තුව පහත දැක්වේ.

	රු.
අයිතිකරුගේ යෙදවීම්	200 000
අපේක්ෂිත අලෙවි ආදායම	300 000
වෙළෙඳ භාණ්ඩ මිල දී ගැනීම	150 000
ගොඩනැගිලි කුලිය ගෙවීම	25 000
වැටුප් හා අනෙකුත් වියදම්	75 000
වෙළෙඳසැලට ලී බඩු මිල දී ගැනීම	200 000

අවශ්‍ය වන්නේ:

සුපුන්ගේ යෝජිත ව්‍යාපාරයේ පළමු මාසය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර, මුළු මුදල් ගලා ඒම්, මුළු මුදල් ගලා යාම් සහ කාලපරිච්ඡේදය අවසානයේ මුදල් ශේෂය දැක්වීම

(ලකුණු 06 යි)

(මුළු ලකුණු 10 යි)

(07)

(i)

1. ඉලක්ක පාරිභෝගිකයා
2. තරගකරුවන්
3. ස්වකීය භාණ්ඩ හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකක් සඳහා ලකුණු 02 යි)

(ii)

1. විදුහල්පති
2. නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන හා අධ්‍යාපන සංවර්ධන)
3. සහකාර විදුහල්පති
4. අංශ ප්‍රධාන
5. ශ්‍රේණි ප්‍රධාන
6. පංතිභාර

(නිවැරදි එක් කරුණකට ලකුණු $\frac{1}{2}$ බැගින් තනතුරු හතරකට ලකුණු 02යි)

(iii)

සුපුන්ගේ ව්‍යාපාරයේ (½)

පළමු මාසය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	රුපියල්	රුපියල්	
<u>මුදල් ගලා ඒම</u> (½)			
• අයිතිකරු යෙදවුම	200 000	(½)	
• අලෙවි ආදායම	300 000	(½)	
මුළු මුදල් ගලා ඒම		5000 000	(½)
<u>මුදල් ගලා යාම</u> (½)			
• වෙළෙඳ භාණ්ඩ මිලදී ගැනීම	150 000	(½)	
• ගොඩනැගිලි කුලි ගෙවීම	25 000	(½)	
• වැටුප් හා අනෙකුත් වියදම්	75 000	(½)	
• ලී බඩු මිල දී ගැනීම	200 000	(½)	
මුළු මුදල් ගලා යාම්		(450 000)	(½)
කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය		50 000	(½)

(ලකුණු 06යි)

(මුළු ලකුණු 10යි)